20th Anniversary

Incorporated by
Parliament Act No. 23 of 2009

# CMA ශ්‍රී ලංකා
# වෘත්තීය වැඩ සටහන
# ශිෂ්‍ය අත්පොත - 2021



**ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ**
**ගණකාධිකාරී ආයතනය (CMA ශ්‍රී ලංකා)**

*ශ්‍රී ලංකා ජාතික වෘත්තීයමය කළමනාකරණ ගණකාධිකාරී ආයතනය*

# පටුන


| | |
|---|---|
| ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (CMA ශ්‍රී ලංකා) | 04 - 06 |
| CMA ශ්‍රී ලංකා වෘත්තීය වැඩසටහන 2018 - 2022 | 07 |
| ශිෂ්‍ය ලියාපදිංචිය | 08 - 09 |
| අධ්‍යයන ක්‍රම | 10 |
| CMA විභාගවලින් නිදහස් වීම | 10 - 12 |
| CMA විභාග | 13 - 17 |
| CMA සාමාජිකයන්ට සහ ශිෂ්‍යයන්ට වෙනත් අධ්‍යාපන සුදුසුකම් ලැබීමට ඇති අවස්ථා | 18 - 19 |
| CMA සුදුසුකම් සඳහා ප්‍රායෝගික පුහුණුව හා සාමාජිකත්වය | 19 - 20 |
| CMA ශ්‍රී ලංකා ආයතනය විසින් ප්‍රදානය කරන ශිෂ්‍යත්ව | 21 |
| CMA ප්‍රදානයන් | 21 |
| වැදගත් දිනයන් | 22 |
| CMA ශ්‍රී ලංකා ආයතනය මගින් පවත්වන වෙනත් පාඨමාලා | 22 |
| CMA ශ්‍රී ලංකා කාර්ය මණ්ඩලය | 23 |
| ලියාපදිංචිවීමේ අයදුම් පත්‍ර | 24 - 29 |

# 1. හැඳින්වීම

## 1.1 ආයතනයේ පසුබිම

අප ආයතනය 1999 දී, CMA Canada (දැන් CPA Canada) ආයතනයේ තාක්ෂණික සහය සහිත ව කැනඩා අන්තර්ජාතික සංවර්ධන ආයතනය (CIDA) මුලික අරමුදල් සහිතව, එහි නිර්මාතෘ මහාචාර්ය ලක්ෂ්මන් ආර්. වටවල මහතා විසින්, කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ සමිතිය (Society of Management Accountants) ලෙස පිහිටුවන ලදුව, වර්ෂ 2000 දී ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය {Institute of Certified Management Accountants of Sri Lanka (CMA)}" 2009 අංක 23 දරණ පාර්ලිමේන්තු පනත මගින් ශ්‍රී ලංකාවේ ජාතික වෘත්තීයමය කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (National Professional Management Accounting Institution in Sri Lanka) ලෙස සංස්ථාපිත කරන ලදී. එය වර්ෂ 2000 ආරම්භයේ සිට මේ දක්වා 16,000 කට වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවක් සහ 2500 කට වැඩි සාමාජික සංඛ්‍යාවක් සහිත ආයතනයක් බවට වර්ධනය වී ඇත. CMA ශ්‍රී ලංකා ආයතනය එහි වෘත්තීය වැඩසටහන හරහා ශ්‍රී ලංකාව තුල කළමනාකරණ ගණකාධිකරණය, මූල්‍ය ගණකාධිකරණය සහ ව්‍යාපාර කළමනාකරණය යන අංශයන් පිලිබඳ න්‍යාය සහ ව්‍යවහාර අධ්‍යයනයන් ප්‍රවර්ධනය කිරීමෙහි ලා මහගු මෙහෙවරක යෙදී සිටියි.

ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ආයතනය (CMA) ජාත්‍යන්තර ගණකාධිකාරිවරුන්ගේ සම්මේලනයේ {International Federation of Accountants (IFAC)} එනම් රටවල් 130 ක් තුළ පැතිරී විහිදී පොදු ව්‍යවහාර, රාජ්‍ය, කාර්මික, සේවා, ව්‍යාපාරික සහ අධ්‍යාපනික ක්ෂේත්‍රයන් ආවරණය කරන ගණකාධිකාරිවරුන් මිලියන 3 කට අධික මුළු සාමාජිකත්වය සහිත වෘත්තීය ගණකාධිකාරී ආයතන 175 ක මුදුන් සංවිධානය වන ජාත්‍යන්තර ගණකාධිකාරිවරුන්ගේ සම්මේලනය {International Federation of Accountants (IFAC)} සාමාජිකයෙකි. ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ආයතනය (CMA), සාර්ක් (SAARC) රටවල මුදුන් සංවිධානය වන දකුණු ආසියානු ගණකාධිකාරිවරුන්ගේ සම්මේලනයේ {South Asian Federation of Accountants (SAFA)} සාමාජිකයකුද වන අතර, ඒ මගින් ඉන්දියාව, පකිස්ථානය, බංග්ලාදේශය සහ නේපාලයේ වෘත්තීය ගණකාධිකරණ සංවිධාන සමග සහෝදරාත්මකව කටයුතු කරයි. ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ආයතනය (CMA), ආසියානු සහ ශාන්තිකර කලාපයේ ගණකාධිකාරී ආයතනවලින් සමන්විත ආසියානු සහ ශාන්තිකර ගණකාධිකාරිවරුන්ගේ සම්මේලනයේ {Confederation of Asian and Pacific Accountants (CAPA) ද සාමාජිකයකු වේ.




## 1.2 ආයතනයේ ප්‍රධාන පරමාර්ථ:

1. කළමනාකරණ ගණකාධිකරණ වෘත්තියෙහි නියැළී සිටින ගණකාධිකාරිවරුන්හට සාමාජිකත්වය ලබාදීම.
2. කළමනාකරණ ගණකාධිකරණයෙහි සියලුම අංශ පිළිබඳව න්‍යාය සහ ව්‍යවහාර අධ්‍යයනයන් ප්‍රවර්ධනය කිරීම.
3. ආයතනයේ සාමාජිකයකුවීමට අරමුණුකරන ඕනෑම පුද්ගලයකු ලියාපදිංචි කිරීම, අධ්‍යාපනය ලබාදීම සහ පුහුණුකිරීම.
4. විභාග පැවැත්වීම සහ සියළුම විභාගවලින් සමර්ථවන සහ ප්‍රායෝගික පුහුණු අවශ්‍යතා සමග අනුගතවන අය සඳහා සාමාජිකත්වය පිරිනැමීම, මෙම නිර්ණායක සම්පූර්ණකරන අය සඳහා නම් කරන ලද අකුරු (designatory letters) භාවිතයට සැලැස්වීම.
5. සාමාජිකයන් කුමන තත්වයන් යටතේ සේවය කළ ද ඔවුන්ගේ සාමාජිකත්ව වෘත්තීයමය ස්වාධීනත්වය සෑමවිටම ආරක්ෂාකිරීම.
6. ආයතනයේ සියලුම සාමාජිකයන් විසින් වෘත්තීයමය චර්යාවේ ඉහළ ප්‍රමිතීන් පවත්වාගෙන යනු ලැබීම.
7. කර්මාන්ත, වාණිජ, අධ්‍යාපන, මූල්‍ය, රාජ්‍ය සේවා සහ තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ ක්ෂේත්‍රයන්හි කළමනාකරණ ගණකාධිකරණ වෘත්තියේ අභිවර්ධනය අඛණ්ඩව කරගෙනයාම.
8. සාමාජිකයන්ගේ සහ ශිෂ්‍යයන්ගේ භාවිතය සඳහා පුස්තකාලය හෝ පුස්තකාල පවත්වාගෙනයාම.
9. ආයතනයේ කටයුතුවලට සම්බන්ධව සහ සාමාජිකයන්ගේ සහ අනෙකුත් අයගේ හෝ පොදු වශයෙන් ගණකාධිකරණ වෘත්තියේ යහපත, ප්‍රයෝජනවත්භාවය සහ කාර්යක්ෂමතාවය වර්ධනය සඳහා උපකාරීවීම පිණිස, පොත්පත්, පත්‍රිකා සහ පුවත් සංග්‍රහ ප්‍රකාශනය කිරීම හෝ බෙදාහැරීම.
10. සාමාජිකයන්ගේ සහ අනාගත සාමාජිකයන්ගේ උද්‍යෝගය වර්ධනය කිරීම උදෙසා පර්යේෂණ සඳහා ශිෂ්‍යත්ව සහ ප්‍රදානයන් පිහිටුවීම සහ ත්‍යාග පිරිනැමීම.
11. ශාස්ත්‍රපති සහ ආචාර්ය මට්ටම් දෙකෙහිදීම සාමාජිකයන්ගේ වෘත්තියමය සංවර්ධනය පිණිස පශ්චාත් කළමනාකරණ සුදුසුකම් ලබාදීම.

## 1.3 පාලක මණ්ඩලය

| | | |
|---|---|---|
| මහාචාර්ය ලක්ෂ්මන් ආර්. වටවල මහතා | FCMA, FCA, FCMA (UK), CGMA | සභාපති |
| එච්. එම්. හෙන්නායක බණ්ඩාර මහතා | FCMA,FCA, B.Com (Sp), Dip.Accy, FMAAT | උප සභාපති |
| ඩබ්. ඒ. ඒ.ඩී.පෙරේරා | FCMA, FCMA(UK), CGMA, FCCA (UK),MBA (Sri. J ) | සාමාජික |
| එම්. ආර්. ඒ. පෙරේරා | FCMA, FCMA(UK), CGMA, MBA (PIM-USJ), B.Sc.(Acc.) | සාමාජික |
| ජේ. එම්. යූ. බී. ජයසේකර | FCMA, FCA, FMAAT, FMAAT, BSc. Mgt.(USJ) | සාමාජික |
| මහාචාර්ය ඒ. එච්. එන්. කාරියවසම් | B.Sc. Management (Public) (Special) (SJP); M.Com (Kelaniya); PhD (Management) (Malaysia); MAAT; Dip.in FM.(India) | සාමාජික |
| එච්. එම්. ඒ. ජයසිංහ මහතා | FCMA, FCA, FCMA (UK), CGMA | සාමාජික |
| ඩබ්. ඒ. එන්. කේ. විජේවර්ධන මහත්මිය | ACMA, FCA, B.Com Sp. (Hon), MBA | සාමාජික |

### ආයතනයේ කමිටු

1) ගිණුම් ප්‍රමිති, මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති, ජාත්‍යන්තර ගණකාධිකාරීවරුන්ගේ සම්මේලනයේ (IFAC) ශ්‍රී ලාංකීය සාමාජික ආයතන, විශ්ව විද්‍යාල සමග සම්බන්ධීකරණය පවත්වා ගැනීම සහ අධ්‍යාපන ගුණාත්මකභාවය පාලනය සහ අධ්‍යාපන ආයතනවල ගුණාත්මකභාවය පාලන විෂය කමිටුව.
2) සමුළු සහ සම්මන්ත්‍රණ, සංකලිත වාර්තාකරණය (IR) පිළිබඳ සම්මාන ප්‍රදානය, පරිඝනක මධ්‍යස්ථානය, ව්‍යාපාරික පාසල් කමිටුව.
3) කාන්තා සංවර්ධන කමිටුව.
4) අධ්‍යාපන, පුහුණු, පිළිගැනීම් හෙවත් සම්භාවනය, සන්නාම ගොඩනැගීම සහ CPD අභිමන්ත්‍රණය කිරීමේ කමිටුව.
5) ආයතනික පාලනය, ආචාර ධර්ම සහ විනය කමිටුව.
6) මුදල් සහ පරිපාලන කමිටුව.
7) සඟරා, තොරතුරු තාක්ෂණය, බැංකු, මූල්‍ය , රක්ෂණ, ආදායම් බදු සහ නීති කමිටුව.
8) සාමාජික, ශිෂ්‍ය, ව්‍යාපාරයේ සිටින වෘත්තීය ගණකාධිකාරීවරුන් (PAIB), CPD සම්මන්ත්‍රණ කමිටුව.
9) රාජ්‍ය අංශයේ අධ්‍යාපනය, ගිණුම් ප්‍රමිති, රාජ්‍ය සහ රජයේ සංස්ථා අභිමන්ත්‍රණය සහ පුවත්පත් කමිටුව.

### ආයතනයේ අනුශාසකවරුන්

| | | |
|---|---|---|
| ගරු මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා | - | අධ්‍යාපන අමාත්‍ය |
| ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා | - | වෙළඳ අමාත්‍ය |
| අතිගරු ඩේවිඩ් මැකිනන් මහතා | - | ශ්‍රී ලංකාවේ කැනේඩියානු මහ කොමසාරිස් |

## උපදේශක මණ්ඩලය

**එච්. ඩී. එස්. අමරසූරිය මහතා**, FCMA, FCA, FCMA (UK)
සිංගර් සමාගමේ හිටපු සභාපති

**ජෝයි තෝමස් මහතා**, MBA, FCMA, C.Dir.
CPA Canada හි සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි

**මහාචාර්ය ජෝන් ඕ මිලර් මහතා**, AO, BA, B.Com, PhD, FCPA, FAICD, FCMA
ඕස්ට්‍රේලියාවේ ස්වින්බර්න් විශ්ව විද්‍යාලයේ කළමනාකරණ උපාධි පාසැලේ හිටපු ප්‍රධානි, මොනෑෂ් විශ්ව විද්‍යාලයේ හිටපු මහාචාර්ය, ආසියානු සහ ශාන්තිකර ගණකාධිකාරිවරුන්ගේ සම්මේලනයේ (CAPA) හි හිටපු සභාපති

**ඒ. එන්. රාමන් මහතා**, FCMA, FCA, FICWA, B.Com.
කළමනාකරණ උපදේශක; ඉන්දියාවේ ICWA හි හිටපු මධ්‍යම කාරකසභික; ජාත්‍යන්තර ගණකාධිකාරිවරුන්ගේ සම්මේලනයේ (IFAC) මුල්‍ය සහ කළමනාකරණ ගණකාධිකරණය පිළිබඳ කමිටුවේ (FMAC) හිටපු සාමාජික

**මහාචාර්ය පී. ආර්. මේතර්**, MA, PhD, FCA (E)W), FCPA
ඕස්ට්‍රේලියාවේ ලාට්‍රොබ් විශ්වවිද්‍යාලයේ, ගණකාධිකරණ අධ්‍යනාංශයේ ප්‍රධානී; හිටපු පීඨාධිපති - (උසස් පර්යේෂණ උපාධි) - ව්‍යාපාර හා ආර්ථික විද්‍යා පීඨය - මොනෑෂ් විශ්වවිද්‍යාලය ඕස්ට්‍රේලියාව

**එස්. ඊ සතරසිංහ මහතා**, FCMA, FCA, BSc.
මූල්‍ය උපදේශක, Brook Bond සමාගමේ හිටපු සභාපති

**එෆ්. එච්. පුවිමානසිංහ මහතා**, FCA, FCMA
පුවිමානසිංහ සහ සමාගමේ හිටපු ජ්‍යෙෂ්ඨ පාර්ශ්වකරු

**මහාචාර්ය හෝ යෙව් කී**, PhD, FCA (S.pore), FCPA (Aust), CFA
සහායක ප්‍රොවොස්ට් (නිපුණතා සහ මානව සංවර්ධන) - සිංගප්පූරු තාක්ෂණික ආයතනය, හිටපු ගණකාධිකරණ අංශ ප්‍රධානි සහ උප පීඨාධිපති - ව්‍යාපාරික පාසල, ජාතික විශ්වවිද්‍යාලය සිංගප්පූරුව.

**මාර්ක් චෞ මහතා**, Bachelor of Business in Business Administration (RMIT)
කලාපීය සාමාන්‍යාධිකාරි - ව්‍යාපාර සංවර්ධන - CPA ඕස්ට්‍රේලියා

## CMA ශ්‍රී ලංකා ආයතනය පිහිටුවීම

**නිර්මාතෘ** - මහාචාර්ය ලක්ෂ්මන් ආර්. වටවල

**තාක්ෂණික සහය** - CMA කැනඩා ආයතනය (දැන් CPA කැනඩා ආයතනය)

**මූලික අරමුදල් සැපයීම** - කැනඩා අන්තර්ජාතික සංවර්ධන ආයතනය (CIDA)

## 2. ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ (CMA) වෘත්තීය සුදුසුකම

ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ (CMA) වෘත්තීය වැඩසටහන, අද පවත්නා සංකීර්ණ, ගතික සහ තරඟකාරී පරිසරය තුළ, සංවිධානයන්හි අරමුණු ළඟාකරගැනීම පිණිස අවශ්‍ය ගෝලීය-දේශීය දෘෂ්ඨිය සහිත දක්ෂ කළමනාකරණ ගණකාධිකාරීන් බිහිකිරීම පිණිස මඟ පෙන්වීමට විශේෂිත, කළමනාකරණ ගණකාධිකරණ පාඨමාලාවකි. එමඟින් තාක්ෂණික දැනුම, වෘත්තියමය කුසලතා, සහ වෘත්තියමය අගයයන්, ආචාර ධර්ම සහ ආකල්ප, තමන් සේවය කරන ස්ථානවල නිශ්චිත ප්‍රමිතියට අනුව සංකලනය කිරීමට සහ උපයෝගී කරගැනීම සඳහා CMA ගණකාධිකාරිවරුන්හට මග පෙන්වයි.

CMA සාමාජිකත්වය ලබාගැනීමට අපේක්ෂා කරන පුද්ගලයන් විසින්, CMA වෘත්තීය වැඩසටහන සාර්ථක ලෙස සම්පූර්ණ කළ යුතු වේ. දක්වා ඇති සියළුම අදාල විභාග, නියම කරනු ලැබ ඇති ප්‍රායෝගික පළපුරුද්ද සහ වෙනත් අවශ්‍යතා සම්පූර්ණ කළ පසු, ඔවුන්හට CMA හි ආශ්‍රිත සාමාජිකත්වය {Associate Membership of the Certified Management Accountants of Sri Lanka (ACMA)} සඳහා ද, ජ්‍යෙෂ්ඨ තලයේ පළපුරුද්ද ලබා ඇති අය සඳහා අධි සාමාජිකත්වය {Fellow Membership of the Certified Management Accountants of Sri Lanka, (FCMA)} සඳහා ද අයදුම් කළ හැකිය. වෘත්තීය වැඩසටහන මගින් ඔවුන් ඉහළ තලයේ ප්‍රවීණත්වය ලබා ගන්නා අතර, ඒ මගින් ඔවුන්හට, කර්මාන්ත, සේවා, හෝ වාණිජ යන කුමන ක්ෂේත්‍රයක වුවද, එසේම, පුද්ගලික සහ රාජ්‍ය අංශවලද, දේශීය හෝ විදේශීය වුව ද, ව්‍යාපාර ලෝකයේ විශිෂ්ඨත්වයෙන් යුක්තව කාර්ය සාධනය සඳහා හැකියාව ලැබේ.

උසස් පෙළ සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන්හට, උපාධි අපේක්ෂකයන්හට, උපාධිධාරීන්හට මෙන් ම රැකියාවල නියුක්ත අය හට ද, දැරියහැකි, නම්‍ය සහ පහසුවෙන් වෘත්තීය සුදුසුකමක් ලබාත හැකි මාර්ගයක් ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය (CMA) ලබාදෙයි.



**මෙම සුදුසුකම්, පහත සඳහන් වර්ගවල අයහට නිර්දේශ කෙරේ.**

- උසස් පෙළට පසු ශිෂ්‍යයන්හට පූර්ණකාලීනව හෝ අර්ධ-කාලීනව.
- විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂකයන්හට.
- විශ්විද්‍යාලවලට ඇතුළුවීම අපේක්ෂාවෙන් සිටින ශිෂ්‍යයන්හට.
- රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශවලද තමන්ගේ රැකියාවන්හි දියුණුවක් අපේක්ෂාකරන උපාධිධාරීන්හට සහ වෙනත් වෘත්තිකයන්හට.
- රැකියාවෙහි නියුක්තව සිටින අයහට රැකියාවෙහි වැඩි දියුණුවක් ලෙස.

## 3. ශිෂ්‍යයන් ලියාපදිංචිකිරීම



ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ (CMA) ශිෂ්‍යයකුබවට පත්වීමේ පළමුවන පියවර වන්නේ ලියාපදිංචි කිරීමයි. ආයතනයේ විභාගවලට පෙනී සිටිය හැක්කේ **ලියාපදිංචි ශිෂ්‍යයන්හට පමණි**. ලියාපදිංචිවීම මුළු වර්ෂය තුළදීම විවෘත ව ඇත.

### 3.1 ඇතුළත්වීම සඳහා අවශ්‍යතා

පහත දැක්වෙන සුදුසුකම්වලින් එකක් සතු අපේක්ෂකයකුහට ශිෂ්‍යයකු ලෙස ලියාපදිංචි වියහැකිය.

1) අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය සඳහා සාමාන්‍ය සාමාර්ථ සහිතව, අ. පො. ස. (උසස් පෙළ) විභාගයෙන් විෂයයන් තුනක් සමත්වීම.

2) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත කරන ලද අදාළ උපාධි හෝ CMA ආයතනයේ පාලක මණ්ඩලය මගින් අනුමත කරණු ලැබූ වෘත්තියමය සුදුසුකම් (නිදහස්කිරීමේ ක්‍රමය යටතේ ලැයිස්තුගත කරනු ලැබ ඇති සම්පූර්ණ හෝ අර්ධ සුදුසුකම්).

3) පරිණත ඇතුලත්කිරීම් - රැකියාවේ යෙදී සිටින, වයස අවුරුදු 18 ට වැඩි, ගිණුම්කරණ ක්ෂේත්‍රයක් තුළ අවම වශයෙන් වර්ෂ 2 ක අත්දැකීම් සහිත ව සේවයේ දී සිටින, සේවාදායකයාගේ නිර්දේශය සහිත අයගේ අයදුම්පත්‍ර, පරිණත ඇතුලත්කිරීම් යටතේ සලකා බැලේ.

4) ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය (CMA) විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්.

## 3.2 ශිෂ්‍ය ලියාපදිංචිය පිණිස ඉදිරිපත් කරන අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ලේඛණ

1) නිසි පරිදි සම්පූර්ණ කරන ලද ශිෂ්‍ය ලියාපදිංචි කිරීමේ අයදුම් පත්‍රය

2) උප්පැන්න සහතිකයේ සහ ජාතික හැඳුනුම්පත්‍රයෙහි සහතික කළ පිටපත්.

3) මුද්දර ප්‍රමාණයේ (3.0 cm x 2.5 cm) වර්ණ ඡායාරූප දෙකක් - එක් ඡායාරූපයක් අයදුම්පත්‍රයෙහි අලවන්න. අනෙක් ඡායාරූපය සහතික කර තිබිය යුතුය. සහතික කරන ලද ඡායාරූපයෙහි පිටුපස ඔබගේ නම සහ අත්සන සඳහන් විය යුතුය. දක්වා ඇති ප්‍රමාණයට වඩා විශාල ඡායාරූප භාරගනු නොලැබේ.

4) අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් පිලිබඳ සහතිකවල සහතික කරන ලද පිටපත්.

5) සහතිකවල සහ අයදුම්පත්‍රයට නොඇලවූ ඡායාරූපය, "ශිෂ්‍ය ලියාපදිංචි අයදුම්පත්‍රය" සහතිකකරන්නා විසින් සහතික කළ යුතුය. (සහතික ඡායා පිටපත්, සහතික කරන්නා විසින් තමන්ගේ නිල මුද්‍රාව තබා සහතික කළ යුතු අතර, එම මුද්‍රාවෙහි, ඔහුගේ / ඇයගේ නම සහ අනෙකුත් විස්තර දැක්විය යුතුය.)

- අයදුම්පත්‍රයෙහි සෑම ස්ථානයකම දැක්වෙන නම, නියතවශයෙන්ම උප්පැන්න සහතිකයෙහි ආකාරයටම විය යුතුය.
- ලේඛනයෙහි නම, උප්පැන්න සහතිකයට වඩා වෙනස් ආකාරයකින් වේ නම්, සාමදාන විනිශ්චයකරුවකු විසින් සහතික කරනු ලබන දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.
- විධිමත් පරිදි සහතික නොකරනු ලබන ඡායාරුපය (අයදුම්පත්‍රයට අලවනු ලබන ඡායාරූපය හැර) සහ සහතිකවල ඡායා පිටපත් භාරගනු නොලැබේ.
- "ශිෂ්‍ය ලියාපදිංචි අයදුම්පත්‍රයේ" ඡායා පිටපත් හෝ ෆැක්ස් මගින් හෝ විද්‍යුත් තැපෑලෙන් සම්පුර්ණ කර එවනු ලබන "ශිෂ්‍ය ලියාපදිංචි අයදුම්පත්‍රය" භාර ගනු නොලැබේ.

6) විශේෂ ගෙවීම් වවුචරයෙහි බැංකු ශාඛාවේ රවුම් මුද්‍රාව සහ බලයලත් නිලධාරියාගේ අත්සන සඳහන් "ආයතන පිටපත", ලියාපදිංචිකිරීමේ අයදුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය. එක් විශේෂ ගෙවීම් වවුචර් පත්‍රයක් භාවිතා කළ යුත්තේ එක් වර්ගයක ගෙවීමක් කිරීමට පමණි; උදා: ලියාපදිංචි ගාස්තු.

7) ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ (CMA) අධ්‍යයන වැඩ සටහනෙහි නිදහස්කිරීම් ලබා ගැනීමට අපේක්ෂා කරන අයදුම්කරුවන්, ලියාපදිංචිවීමේ අයදුම් පත්‍රයෙහි දී ඇති උපදෙස් පරිදි, එහි "ඊ කොටස" සම්පුර්ණ කළ යුතු ය. ඔබ දරන සුදුසුකම් සාර්ථක ලෙස සම්පූර්ණ කිරීම සනාථ කිරීම පිණිස, ප්‍රථිපල සනාථ කිරීමේ ලිපිය හෝ සුදුසුකම්වල සහතික කළ පිටපත් ඔබ විසින් ඉදිරිපත් කළ යුතු වේ.

8) "ශිෂ්‍යයන් ලියාපදිංචිකිරිම සඳහා අයදුම් පත්‍රය", ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "ශිෂ්‍යයන් ලියාපදිංචිකිරිම සඳහා අයදුම් පත්‍රය" යන වචන සඳහන් කර, අවශ්‍ය ලේඛන සමග ලියාපදිංචි තැපෑලෙන් ලේකම් කාර්යාලය වෙත එවිය යුතු ය.

**ගාස්තු** (වෙනස්වීමට යටත්ව)

**ලියාපදිංචිවීමේ ගාස්තුව සහ වාර්ෂික දායකත්ව මුදල**

| | |
|---|---|
| ලියාපදිංචිවීමේ ගාස්තුව | රු. 1,750 |
| වාර්ෂික දායකත්ව මුදල | රු. 2,250 |
| ලියාපදිංචිවීමේදී මුළු මුදල | රු. 4,000 |

**නිදහස්කිරීමේ ගාස්තු**

| අදියර | එක් විෂයයක් සඳහා (රු.) |
|---|---|
| පදනම් අදියර | 3,750 |
| මෙහෙයුම් අදියර | 4,000 |
| කළමනාකරණ අදියර | 4,500 |
| මුදුන් අදියර - CBA | 12,000 |

**විභාග ගාස්තු** (වෙනස්වීමට යටත්ව)

| අදියර | එක් විෂයයක් සඳහා (රු.) |
|---|---|
| පදනම් අදියර | 3,750 |
| මෙහෙයුම් අදියර | 4,000 |
| කළමනාකරණ අදියර | 4,500 |
| උපායමාර්ගික අදියර | 5,500 |
| මුදුන් Apex Level | |
| - විෂයානුබද්ධ සිද්ධි අධ්‍යයනය | 9,000 |
| - පරිගණක ආශ්‍රිත ගිණුම්කරණය | 8,000 |
| උසස් වෘත්තීයමය සන්නිවේදන මොඩියුලය (කථන ශිල්පී වැඩසටහන සහ වැඩමුළු මාලාව) | 10,000 |

**අනෙකුත් ප්‍රකාශන සහ ලේඛණ**

| විස්තර | පොතක් සඳහා මිළ (රු.) |
|---|---|
| ශිෂ්‍ය අත්පොත | 250 |
| PER ලොග් පොත සහ මාර්ගෝපදේශය | 350 |
| ප්‍රථිපල ලිපිය | 1,000 |
| ශිෂ්‍ය හැඳුනුම්පත | 250 |



# 4. අධ්‍යයන ක්‍රමය

## 4.1. අධ්‍යයන උපකාරක

CMA අධ්‍යයන වැඩසටහනේ සෑම විෂයයක් සඳහාම අධ්‍යයන පෙළපොත් ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ආයතනයේ (CMA) අලෙවිකිරීමට ඇත. ආයතනය විසින් සියලුම අදියරයන් සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් ද, පළමු අදියර දෙක සඳහා සිංහල සහ දෙමළ භාෂාවන්ගෙන් ද පෙළපොත් සකස්කරනු ලැබ ඇත.

සෑම ශිෂ්‍යයකුම පෙළපොත්, මුද්‍රිත පොත් / CD වශයෙන් මිළදී ගැනීම හෝ විද්‍යුත්- අධ්‍යයන ක්‍රමය (E-LEARNING) සඳහා ලියාපදිංචිවීම, 2013 නොවැම්බර් විභාගයේ සිට අනිවාර්ය කිරීමට ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ආයතනයේ (CMA) පාලක මණ්ඩලය විසින් තීරණය කරනු ලැබ ඇත.

### අධ්‍යයන පෙළපොත් ගොනුවේ මිළ

| අදියර | පොතක මිළ (රු.) | CD එකක මිළ (රු.) |
|---|---|---|
| පදනම් | 900 | 600 |
| මෙහෙයුම් | 1,200 | 650 |
| කළමනාකරණ | 1,300 | 750 |
| උපාය මාර්ගික | 1,500 | 750 |
| මුදුන්: | | |
| - විෂයානුබද්ධ සිද්ධි අධ්‍යයන පෙළපොත (ICS) | 1,500 | 750 |
| - පරිගණක ආශ්‍රිත ගිණුම්කරණය (CBA) පෙළපොත | 1,000 | 750 |

## 4.2. අනුමත අධ්‍යාපන ආයතන {ACCREDITED EDUCATION INSTITUTES (AEI)}

ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (CMA) විසින් පිළිගනු ලැබ ඇති ආයතනවල දේශනවලට සහභාගීවීමට ශිෂ්‍යයන්හට අවස්ථාව සලසා ඇත. අනුමත අධ්‍යාපන ආයතන නම් ලැයිස්තුව, CMA නිල වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

## 4.3. විද්‍යුත්-අධ්‍යයනය (E-LEARNING)

තමන්ගේ අධ්‍යයන කටයුතු, නම්‍යශීලීව තමන්හට පහසු වේලාවන්හිදී සහ පහසු ආකාරයට කරගත හැකි බැවින්, CMA ශිෂ්‍යයන් අතර විද්‍යුත්-අධ්‍යයනය ජනප්‍රියවෙමින් පවතී.

2020 මැයි මස පවත්වන ලද විභාගයට පෙනීසිටි ශිෂ්‍ය ශිෂ්‍යාවන්හට පහසුකම් සැලසීම සඳහා, අගුලු දමා තිබු කාල පරිච්ඡේදය තුල දී, එනම්, 2020 අප්‍රේල් මස 19 වන දිනදී, CMA ශ්‍රී ලංකා ආයතනය විසින් මාර්ග-ගත (ONLINE) ඉගෙනීමේ වේදිකාවක් (VIRTUAL LEARNING PLATFORM) ආරම්භ කරන ලදී.

විද්‍යුත් අධ්‍යනය මගින් පහත සඳහන් පහසුකම් සලසනු ලබයි.

- පදනම් අදියර - සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍ය වලින් පටිගත කරන ලද සම්පූර්ණ දේශන මාලාවක් ලබාගත හැකිය.
- මෙහෙයුම් අදියර සිට උපායමාර්ගික අදියර - පසුගිය විභාග ප්‍රශ්නපත්‍ර සාකච්ඡා කිරීමේ වැඩසටහන් අදාල විභාග දිනයන්ට පෙර පවත්වනු ලබයි.
- මුදුන් අදියර - විෂයානුබද්ධ සිද්ධි අධ්‍යනය සඳහා (SCENARIO I ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව) විභාග පෙරහුරු සම්මන්ත්‍රණ මාලාවක් පවත්වනු ලබයි.

මෙම පහසුකම් පිලිබඳ විස්තර, CMA වෙබ් අඩවියේ පලකරන අතර ශිෂ්‍ය සේවා අංශයෙන් සහ අධ්‍යයන සහ පුහුණු අංශයෙන් ද ලබාගත හැකි ය.

## 4.4. ස්වයං අධ්‍යනය

ශිෂ්‍යයන්හට CMA මුද්‍රිත පෙළපොත් / CD භාවිතා කරමින් හෝ මාර්ග-ගත ඉගෙනීම (VIRTUAL LEARNING) මගින් ස්වයං අධ්‍යනය කළ හැකිය.

# 5. විභාග වලින් නිදහස් කිරීම්

## නිදහස්කිරීම් සඳහා මගපෙන්වීම

- වෘත්තීය සහ අධ්‍යාපනික සුදුසුකම් පිළිගැනීම මත පදනම්ව නිදහස්කිරීම් දෙනු ලැබේ.
- අදාළ සුදුසුකම් මගින් අවශ්‍ය අදියරේ දැනුම, කුසලතාවය සහ ප්‍රවීණතාවය, සපුරාලන්නේ නම් පමණක් නිදහස්කිරීම් ප්‍රදානය කෙරෙන අතර, එසේ කෙරෙනුයේ ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ (CMA) අභිමතය පරිදි ය.
- නිදහස්වීම් මගින් ලබාගත් සුදුසුකම් සඳහා නිදහස්වීම් දෙනු නොලැබේ.
- විෂය නිදහස්කිරීම් සඳහා සුදුසුකම් ලබන සියළුම ශිෂ්‍යයන්, එලෙස නිදහස් කෙරෙන විෂයයන් සඳහා ගාස්තුවක් ගෙවිය යුතු වේ. පවත්නා ගාස්තු පිළිබඳව තොරතුරු CMA වෙබ් අඩවියෙන් සහ අදාළ සැසිය සඳහා ඇති ශිෂ්‍ය මාර්ගෝපදේශ ලේඛණයෙන් දැනගත හැකිය.
- සුදුසුකම්වල, CMA විෂය නිර්දේශය ප්‍රමාණවත් පරිදි ආවරණය කිරීමක් නොමැතිවිට, නිදහස්කිරීම් ප්‍රදානය නොකෙරේ.
- අදාළ වැඩසටහන යටතේ නිදහස්කිරීම් ලබාගැනීම සඳහා ශිෂ්‍යයාහට අදාළ සුදුසුකම් ලබාගැනීම පිණිස සම්පූර්ණකළ යුතු විශේෂිත මට්ටමක් / අදියරක් / වර්ෂයක් පවත්නා විට, පොදු නියමයක් ලෙස එම සුදුසුකම් සපුරාලන්නේ නම් පමණක් , එම පදනම මත නිදහස්කිරීම් ප්‍රදානය කෙරේ.
- විශේෂ අවස්ථාවලදී හැර, විෂයය සඳහා විෂයයක් යන පදනම යටතේ නිදහස්කිරීම් සලකා බලනු නොලැබේ.
- ශිෂ්‍යයකු නිදහස්කිරීමක් සඳහා ඉල්ලීමක් කළ පසු, ඔහු/ඇය පසුව පූර්ණ සුදුසුකම් ලබන්නේ නම් හැර, පසුව ඉදිරිපත් කෙරෙන දෙවන අයදුම්පතක් භාර නොගැනේ.
- ශිෂ්‍යයකු CMA විභාගයකට පෙනී සිට අසමත් වුවහොත් එම විෂයයන් සඳහා නිදහස්කිරීම් දෙනු නොලැබේ.
- ශාස්ත්‍රපති/විද්‍යාපති සුදුසුකම් සඳහා නිදහස් කිරීම් වෙන්ව සලකා බැලේ. දෙනු ලැබ ඇති ප්‍රතිපත්තියෙහි විශේෂිත වැඩසටහනක් ඇතුලත් කරනු ලැබ නොමැති නම්, වෙනම ඇගයීමක් කරනු ලබන අතර, අදාළ නිදහස් කිරීම ශිෂ්‍යයා වෙත දැනුම් දෙනු ලැබේ.
- උපාධියක කාලය වර්ෂ හතරක් නම්, අභ්‍යන්තර උපාධිය

සහ බාහිර උපාධිය අතර ප්‍රභේදනයක් නැත. උපාධියේ කාලය වර්ෂ තුනක් නම්, එවිට CMA පදනම් අදියරයෙන් නිදහස් කෙරෙන අතර, මෙමෙහෙයුම් අදියරේ ව්‍යාපාර ඉංග්‍රීසි II විෂයයෙන් නිදහස් කෙරේ.

- උපාධි අපේක්ෂයන් සඳහා නිදහස්කිරීම් සලකා බැලෙන්නේ සම්පූර්ණ කරනු ලැබ ඇති වර්ෂ අනුව, විෂයයෙන් විෂයය පදනම මත ය. වර්ෂය සඳහා දෙනලද සියලුම මොඩියුල සාර්ථක ලෙස සම්පූර්ණ කරනු ලැබ ඇති බවට සහතික කිරීම සඳහා ශිෂ්‍යයන් විසින් ලේඛන ඉදිරිපත් කළ යුතු වේ.
- ශිෂ්‍යයකු උපාධියේ පළමුවන වර්ෂයේදී අදාළ විෂයයක් කරනු ලැබ ඇති වුවද, ඔහු උපාධියේ පළමුවන වර්ෂය පමණක් සම්පූර්ණ කර ඇත්නම්, මෙහෙයුම් අදියරේ ප්‍රධාන විෂයයන් (core subjects) සඳහා නිදහස් කරනු ලැබීමට සුදුසුකම් නොලබයි.
- CMA විසින් ඇගයීම් කරනුයේ විශ්ව විද්‍යාල කොමිෂන් සභාව (UGC) විසින් අනුමත කරනු ලැබ ඇති විශ්ව විද්‍යාල මඟින් ප්‍රදානය කරනු ලබන උපාධි පමණි.
- 2007 වර්ෂයට පෙර ලබාගෙන ඇති උපාධි වෙනම අගයනු ලබන අතර, ඒ සඳහා සුදුසු නිදහස්කිරීම් කරනු ලැබේ.

## 5.1 නිදහස්කිරීම් සඳහා ඉල්ලුම්කිරීම

නිදහස්කිරීම්වලට අදාළ වැදගත් තොරතුරු අවබෝධකර ගැනීම සඳහා අපගේ වෙබ් අඩවියේ "නිදහස්කිරීමේ ප්‍රතිපත්ති අත්පොත" ("Handbook on Exemptions Policy") කියවන්න.

ඔබගේ විශ්වවිද්‍යාලය/වෘත්තීය ආයතනය මඟින් ප්‍රදානය කරන උපාධි/ වෘත්තීය පාඨමාලා CMA වෘත්තීය වැඩසටහන යටතේ නිදහස් කිරීම ලැබීමට සුදුසුකම් සපුරා තිබේද යන්න දැනගැනීම සඳහා "නිදහස් කිරීම් ප්‍රදානය කෙරෙන ක්‍රමය (Exemptions Awarding Scheme 5.2) පරීක්ෂා කරන්න.

1. ඔබ අලුතින් ලියාපදිංචි වූ අයකු නම් සහ ලියා පදිංචිවීමේදී නිදහස් කිරීමක් ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම්, කරුණාකර ලියා පදිංචිවීමේ අයදුම් පත්‍රයෙහි ඊ කොටස සම්පූර්ණ කර, (දී ඇති ආකෘතියෙහි) විශ්ව විද්‍යාලයේ / ආයතනයේ ප්‍රථිපල සනාථ කිරීම හෝ ප්‍රථිපල ලේඛනයේ / සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපතක් සහ නිදහස් කිරීම් ගාස්තු ගෙවීම සඳහා ඇති (අලුතින් ලියා පදිංචි වන අයට පමණක් අදාල වන) විශේෂ ගෙවීම් වවුචරයේ ආයතන පිටපත අමුණා ඉදිරිපත් කරන්න.

   සුදුසුකම් සහ අදාලවන නිදහස්කිරීමේ ගාස්තුව දැනගැනීම පිණිස නිදහස්කිරීම් ප්‍රදානය කෙරෙන ක්‍රමය (Exemptions Awarding Scheme - 5.2) බලන්න..
2. දැනටමත් ලියා පදිංචි වී ඇති සහ නිදහස් කිරීම පිණිස අපේක්ෂා කරන අය, CMA වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකි අයදුම් පත්‍රය සම්පූර්ණ කර, (දී ඇති ආකෘතියෙහි) විශ්ව විද්‍යාලයේ / ආයතනයේ ප්‍රථිපල සනාථ කිරීම හෝ ප්‍රථිපල ලේඛනයේ / සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපතක් සහ නිදහස් කිරීම් ගාස්තු ගෙවීම සඳහා ඇති ගෙවීම් වවුචරයේ ආයතන පිටපත අමුණා ඉදිරිපත් කරන්න.
3. ඔබගේ සුදුසුකම් නිදහස්කිරීම් ප්‍රදානය කෙරෙන ක්‍රමය යටතේ ලැයිස්තු ගත කරනු ලැබ නොමැතිනම්, ඔබගේ සුදුසුකම් සම්බන්ධයෙන් වෙනම ඇගයීමක් කර ගැනීමට ඔබට සිදු වේ. ඔබගේ ලේඛනවල ස්කෑන් කරන ලද පිටපත් exemptions@cma-srilanka.org වෙත එවන්න; නැතහොත්, ඔබගේ විමසීම මාර්ගගත (online) ලෙස CMA වෙබ් අඩවියට එවන්න.

ඔබගේ ලියාපදිංචිවීම ස්ථිර කිරීමෙන් පසු, නිදහස් කිරීම පිළිබඳව දින 20 ක් ඇතුළත ඔබ වෙත දැනුම් දෙනු ලබන අතර, ඉතිරි විෂයයන් සඳහා විභාගය සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීමට ඔබට අවසර ලැබෙනු ඇත.

ඔබට නිදහස් කිරීම ලැබීමෙන් පසු ඔබ පළමුව පෙනී සිටින විභාගයේ ප්‍රථිපල සමග, ඔබට දෙනලද නිදහස්කිරීම ඔබගේ 'My CMA' ගිණුමෙහි පෙන්නුම් කෙරෙනු ඇත.

## 5.2 නිදහස්කිරීම් ප්‍රදානයකිරීමේ ක්‍රමය සහ අදාලවන ගාස්තු

*වගුව 01. CMA නිදහස්කිරීම සඳහා පිළිගනු ලබන විශ්ව විද්‍යාල සහ ආයතන*

| CODE | Univesity/Insitute | CODE | Univesity/Insitute |
|---|---|---|---|
| USJ | Universiy of Sri Jayewardenepura | CA | Institute of Chartered Accountants of Sri Lanka |
| UOC | University of Colombo | CIMA | Chartered Institute of managementAccountants -UK |
| UOK | University of Kelaniya | AAT | AAT Sri Lanka |
| WUSL | Wayamba University of Sri Lanka | ACCA | ACCA-UK |
| SEUSL | South eastern University of SL | HNDA | HNDA-SLIATE |
| SUSL | Sabaragamuwa University of Sri Lanka | HNDBA | HNDBA-SLIATE |
| UWU | Uva Wellassa Uinversity | HNDBF | HNDBF-SLIATE |
| UOJ | University of Jaffna | IBSL | Institute of Bankers of Sri Lanka |
| RUSL | Rajarata University of Sri Lanka | SLIM | Sri Lanka Institute of Marketing |
| UOR | University of Ruhuna | SLIIT | Sri Lanka Institute of Information Technology |
| UOP | University of Peradeniya | NIBM | National Institute of Business Management |
| EUSL | Eastern University ,Sri Lanka | NSBM | National School of Business Management |
| TR | Trincomalee Campus | VC | Vavuniya Campus |
| If your Institute /University is not listed above please send your transcripts to exemptions@cma-srilanka.org or contact CMA Registration Division for more information | | | |

** ඉහත ලැයිස්තුගත කර නැති විදේශීය උපාධි සහ සුදුසුකම්, වෙනම ඇගයීම් කරනු ලැබේ.*

*වගුව 02: වගුව 01 හි දක්වා ඇති ආයතන මගින් පිරිනැමෙන සුදුසුකම් සහ උපාධි විශේෂීකරණයන් සඳහා අදාළ වන නිදහස්කිරීමේ ක්‍රම ලැයිස්තුව.*

| | MANAGERIAL | | | | | OPERATIONAL | | | | | | FOUNDATION | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Fee applicable | PC | CLT | MPI | CRA | AMA | ITA | BE II | BLT | MBO | AFF | MA | BE I | QMB | FME | FAF | MAF | Specialization CODE | Specialization/stage/-year completed |
| 60750 | X | X | X | X | | X | X | X | X | X | X | X | X | X | X | X | ACC | Accounting Sp. |
| 56250 | X | X | X | | | X | X | X | X | X | X | X | X | X | X | X | COM | B.Com Sp. |
| 47250 | X | | | | | X | X | X | X | X | X | X | X | X | X | X | FIN/FM | Finance/Fin: Mgt. Sp. |
| 39250 | X | | | | | X | X | X | X | | | X | X | X | X | X | HRM/MKT | HRM/Marketing |
| 39250 | X | | | | | X | X | X | X | | | X | X | X | X | X | BM | Business Mgt. |
| 39750 | X | | X | | | X | X | | X | | | X | X | X | X | X | ECN | BBA Economics Sp. |
| 47250 | X | | | | | X | X | X | X | X | X | X | X | X | X | X | BA | Business Admin Sp. |
| 39750 | X | | X | | | X | X | | X | | | X | X | X | X | X | OM/EMV/PUB/IBUS | Operations Mgt/Estate Mgt. Val./Public Mgt/ Inter: Bus: |
| 35750 | X | | X | | | X | X | | | | | X | X | X | X | X | BIS/BT | Busi: Info Sys Sp./business tech |
| 31250 | X | | | | | X | X | | | | | X | X | X | X | X | BANK/ENT/THM/EBM | Banking/Entreprenurship/ Tourism & Hospitality/EBM/ Entre: Development |
| 43750 | X | | X | | | X | X | | X | X | | X | X | X | X | X | ENM | ENM Degree |
| 15250 | | | | | | X | | | | | | X | X | | X | | D-01 | 1st year completed |
| 26750 | | | | | | X | X | | | | | X | X | X | X | X | D-02 | 2nd year completed |
| 30750 | | | | | | | X | X | | X | | X | X | X | X | X | AAT-15 | AATSL 2015 PF |
| 18750 | | | | | | | | | | | | X | X | X | X | X | AAT-10 | AAT SL 2010 PF |
| 18750 | | | | | | | | | | | | X | X | X | X | X | E | CA SL-Executive |
| 51750 | X | X | | | | X | X | X | X | X | X | X | X | X | X | X | B | CASL- Business |
| 60750 | X | X | | X | X | X | X | X | X | X | X | X | X | X | X | X | C | CASL- Corporate/ACA |
| 11250 | | | | | | | | | | | | X | | | X | X | FL | CIMA -UK Foundation |
| 38750 | | | | | | | X | | X | X | X | X | X | X | X | X | OL | CIMA -UK Operational |
| 52250 | | | X | X | X | X | X | | X | X | X | X | X | X | X | X | ML | CIMA -UK Managerial |
| 65250 | X | X | X | X | X | X | X | X | X | X | X | X | X | X | X | X | SL | CIMA -UK PF |
| 18750 | | | | | | | | | | | | X | X | X | X | X | K | ACCA- F1-F3 |
| 34750 | | | | | | X | X | | | X | X | X | X | X | X | X | S | ACCA- F1-F9 |
| 65250 | X | X | X | X | X | X | X | X | X | X | X | X | X | X | X | X | P | ACCA affliate/Member |
| 11250 | | | | | | | | | | | | X | X | | X | | E-1-07 | HNDA-1st year completed - SLIATE |
| 27000 | | | | | | X | X | | | X | | X | X | | X | X | E-02-07 | HNDA-2nd year completed - SLIATE |
| 56250 | X | X | X | | | X | X | X | X | X | X | X | X | X | X | X | E-4-07 | HNDA-3rd, 4th year/ completed SLIATE |
| 18750 | | | | | | | | | | | | X | X | X | X | X | DBF | IBSL-DABF |

*All students are required to sit the Strategic Level & Apex Level after completing the Managerial Level.

# 6. CMA විභාග

## 6.1 විභාග විෂය නිර්දේශය

පළමුවන විෂය නිර්දේශයේ ව්‍යුහයය, CMA Canada (දැන් CPA Canada) ආයතනයේ තාක්ෂණික සහයෝග යෙන් සකස් කරන ලදී. වර්තමාන විෂය නිර්දේශයේ ව්‍යුහය, ජාත්‍යන්තර ගණකාධිකාරිවරුන්ගේ සම්මේලනයේ (IFAC) ජාත්‍යන්තර ගණකාධිකරණ ප්‍රමිති මණ්ඩලය {International Accountancy Standards Board (IAESB) විසින් නිර්දේශිත පරිදි, ජාත්‍යන්තර අධ්‍යාපන ප්‍රමිතින් {International Education Standards (IESs)} සැලකිල්ලට ගනිමින්, විද්වත් උපදේශක මණ්ඩලයක් විසින් වැඩි දියුණු කරන ලදී. මෙම විෂය නිර්දේශය CMA සාමාජිකයින් කළමනාකරණ ගණකාධිකාරිවරුන් වශයෙන් පමණක් නොව, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායමක රාජකාරි කටයුතු කිරීමට ද හැකිවන ආකාරයට සුදානම් කරවන අයුරින් සකසා ඇත.

## 6.2 විෂය නිර්දේශයේ ව්‍යුහයය

ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ (CMA) වෘත්තීය සුදුසුකම් ලබා ගැනීම සඳහා අපේක්ෂකයකු විසින් සපුරාලිය යුතු සුදුසුකම්

(අ) අධ්‍යයන වැඩ සටහන සම්පූර්ණ කිරීම

(ආ) උසස් වෘත්තීයමය සන්නිවේදන මොඩියුලය (කථන ශිල්පී වැඩසටහන සහ වැඩමුළු මාලාව) සම්පූර්ණ කිරීම

(ඇ) ආයතනය විසින් නියම කරනු ලබන වසර තුනක ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීම


අධ්‍යයන වැඩ සටහන අදියර පහකින් සමන්විත වේ:

අදියර 1 - (පදනම්), අදියර 2 - (මෙහෙයුම්), අදියර 3 - (කළමනාකරණ), අදියර 4 - (උපාය මාර්ගික), අදියර 5 - (Apex - මුදුන්). මේ අදියරයන් සියල්ලම එකතුව පාඨමාලා ඒකක විසි දෙකකින් සමන්විත වේ. අවසාන සාමාර්ථය ලැබූ අයකු (Passed Finalist) බවට පත්වීම සඳහා උසස් වෘත්තීයමය සන්නිවේදන මොඩියුලය (කථන ශිල්පී වැඩසටහන සහ වැඩමුළු මාලාව) සම්පූර්ණ කිරීම අත්‍යවශ්‍ය ය. ප්‍රායෝගික පළපුරුද්ද ලබාගැනීමේ අවශ්‍යතාවය වර්ෂ තුනක කාලසීමාවක් වන අතර, එය, අධ්‍යයන වැඩ සටහන සම්පූර්ණ කරනු ලබන කාල සීමාව තුළ හෝ ඉන් පසු ලබාගත හැකිවේ. මෙය CMA ආශ්‍රිත සාමාජිකත්වය ලබාගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ.

- 2018 මාර්තු මස සිට පදනම් අදියරේ සියලුම විභාග පරිගණක ආශ්‍රිත ඇගයීම් වන අතර ප්‍රශ්න පත්‍ර බහුවරණ ප්‍රශ්න වලින් සමන්විතවේ.
- 2021 මැයි මස සිට මෙහෙයුම් අදියර හා කළමනාකරණ අදියරේ විභාග පරිගණක ආශ්‍රිත ඇගයීම් ලෙස පැවැත්වෙයි.
- උපායමාර්ගික අදියරේ විභාග ලිඛිත ඇගයීම් වේ.
- මුදුන් අදියරේ ඇගයීම් පහත පරිදි වෙයි.

AL 1 - විෂයනුබද්ධ සිද්ධි අධ්‍යයනය - ලිඛිත ඇගයීම්
AL 2 - පරිගණක ආශ්‍රිත ගිණුම්කරණය (CBA ) - පරිගණක ආශ්‍රිත ඇගයීම්
AL 3 - උසස් වෘත්තීයමය සන්නිවේදනය - Speech craft - වාචික ඇගයීම්

## 2018 - 2022 CMA ශ්‍රී ලංකා වෘත්තීයමය වැඩසටහන



## 6.3 CMA වෘත්තීය වැඩ සටහනෙහි විෂයයන්: 2018 - 2022 විභාග ව්‍යුහය

| විෂය අංකය | විෂය | විභාග පැය ගණන | ඇගයීමේ ක්‍රමය |
|---|---|---|---|
| | **පදනම් අදියර** | | |
| | **ප්‍රධාන** | | |
| FL 1 | කළමනාකරණ ගිණුම්කරණ මූලධර්ම | 02 | CBE |
| FL 2 | මූල්‍ය ගිණුම්කරණ (70%) සහ මූල්‍ය මූලධර්ම (30%) | 02 | CBE |
| FL 3 | කළමනාකරණ (60%) සහ ආර්ථික විද්‍යාවේ (40%) මූලධර්ම | 02 | CBE |
| | **උපකාරක** | | |
| FL 4 | ව්‍යාපාර සඳහා ප්‍රමාණාත්මක ක්‍රම | 02 | CBE |
| | **කුසලතා** | | |
| FL 5 | ව්‍යාපාර ඉංග්‍රීසි I | 02 | CBE |
| | **මෙහෙයුම් අදියර** | | |
| | **ප්‍රධාන** | | |
| OL 1 | කළමනාකරණ ගිණුම්කරණය | 03 | CBE |
| OL 2 | උසස් මූල්‍ය ගිණුම්කරණය (70%) සහ මූල්‍ය (30%) | 03 | CBE |
| OL 3 | ව්‍යාපාර මෙහෙයුම් කළමනාකරණය (මෙහෙයුම් කළමනාකරණය -40%, මානව සම්පත් කළමනාකරණය - 30%, අලෙවිකරණය -30%) | 03 | CBE |
| | **උපකාරක** | | |
| OL 4 | ව්‍යාපාර නීති (50%) සහ බදුකරණය (50%) | 04 | CBE |
| | **කුසලතා** | | |
| OL 5 | ව්‍යාපාර ඉංග්‍රීසි II | 02 | CBE |
| OL 6 | තොරතුරු තාක්ෂණ භාවිතය | 02 | CBE |
| | **කළමනාකරණ අදියර** | | |
| | **ප්‍රධාන** | | |
| ML 1 | උසස් කළමනාකරණ ගිණුම්කරණය | 03 | CBE |
| ML 2 | සාංගමික වාර්තාකරණය සහ විශ්ලේෂණය | 03 | CBE |
| ML 3 | ව්‍යාපෘති සහ තොරතුරු පද්ධති කළමනාකරණය | 03 | CBE |
| | **උපකාරක** | | |
| ML 4 | සාංගමික නීති සහ උසස් බදුකරණය | 04 | CBE |
| | **කුසලතා** | | |
| MI 5 | වෘත්තීයමය සන්නිවේදනය | 02 | CBE |
| | **උපායමාර්ගික අදියර** | | |
| | **ප්‍රධාන** | | |
| SL 1 | උපායමාර්ගික කළමනාකරණ ගිණුම්කරණය | 03 | PBE |
| SL 2 | මූල්‍ය උපායමාර්ග සහ තක්සේරුකිරීම | 03 | PBE |
| SL 3 | ව්‍යාපාර උපායමාර්ග (70%) සහ අවදානම් කළමනාකරණය (30%) | 03 | PBE |
| SL 4 | සාංගමික පාලනය (40%), පාලන උපායමාර්ග (30%) සහ ආචාර ධර්ම (30%) | 03 | PBE |
| | **Apex - මුදුන් අදියර** | | |
| | **කුසලතා** | | |
| AL 1 | විෂයානුබද්ධ සිද්ධි අධ්‍යයනය (Integrative Case Study) | 03 | PBE |
| AL 2 | පරිඝනක ආශ්‍රිත ගිණුම්කරණය | 03 | CBE |
| AL 3 | උසස් වෘත්තීයමය සන්නිවේදන මොඩියුලය (කථන ශිල්පී වැඩසටහන සහ වැඩමුළු මාලාව) | 12 sessions (03 hours per session) | Oral assessments |

CBE – පරිඝනක ආශ්‍රිත ඇගයීම
PBE – ලිඛිත ඇගයීම්

## 6.4 ඇගයීම

අධ්‍යයන වැඩසටහනෙහි පාඨමාලා ඒකක ඇගයීම් ක්‍රමයන්, පරීක්ෂණක පාදක, ලිඛිත, ප්‍රායෝගික සහ වාචික ඇගයීම් වලින් සමන්විත වේ. එකිනෙක පාඨමාලා ඒකකවලට අදාළ ප්‍රශ්න පත්‍රවල සංයුතිය සහ ඇගයීම් පටිපාටිය, අදාළ පාඨමාලා විෂය නිර්දේශයන්හි දී ඇත. යම් ප්‍රධාන හෝ සහායක පාඨමාලාවක සමර්ථකිරීමේ ලකුණු ගණන 50 ක් වන අතර, ශ්‍රේණිගතකිරීමේ පටිපාටිය පහත දී ඇත. කුසලතා පාඨමාලා ඒකක සඳහා ඇගයීමේදී, සමර්ථවීමේ ලකුණුවන්නේ 50 වන අතර, එය සමර්ථ හෝ අසමර්ථ වශයෙන් වනු ඇත. උසස් වෘත්තීයමය සන්නිවේදන මොඩියුලය සඳහා සහභාගීත්ව සහතිකයක් පිරිනමනු ලබයි.

## 6.5 ශ්‍රේණිකිරීමේ පටිපාටිය

| | |
|---|---|
| A | විශිෂ්ඨ |
| B | අධි සාමාර්ථය |
| C | සමර්ථ තත්වය |
| D | ආන්තික |
| E | අසමර්ථ |
| F | අධි අසමර්ථය |

## 6.6 පාඨමාලාවේ අදියරයන් කරා ප්‍රගතිය

එක් අදියරක සිට ඊළඟ අදියර දක්වා ඉහළට යාම පහත පරිදි ය.

(අ) පළමු අදියර තුනේදී පහත දක්වා ඇති අවශ්‍යතාවයනට යටත්ව, ශිෂ්‍යයන්ට එක් වරකදී, උපරිම වශයෙන් පාඨමාලා ඒකක හයක්(ප්‍රධාන, සහායක සහ කුසලතා) සඳහා පෙනී සිටිය හැකිය.

- කළමනාකරණ ගිණුම්කරණ ධාරාව (FL 1, OL 1, ML 1 සහ SL 1) සහ;
- මූල්‍ය ගිණුම්කරණ ධාරාව (FL 2, OL 2, ML 2 සහ SL 2) සහ
- නීතිය සහ බදුකරණය (OL 4 සහ ML 4) සහ
- ව්‍යාපාර ඉංග්‍රීසි ධාරාව (FL 5, OL 5 සහ ML 5), යන ඒකක තර්කානුකූල අනුපිළිවෙලක් සහිත වේ.

ඉහළ අදියරේ පාඨමාලා ඒකක අධ්‍යයනය කිරීම සඳහා පෙර අදියරේ අදාල පාඨමාලා ඒකකය සාර්ථක ලෙස සම්පූර්ණ කළ යුතු වේ.

(ආ) ඊලඟ අදියරේ විෂයයන් සඳහා අයදුම්කිරීමට අපේක්ෂිත ශිෂ්‍ය ශිෂ්‍යාවන්, ඒ සමග ඊට පෙර අදියරේ ඉතිරිව පවත්නා විෂයයන් සඳහා ද අයදුම් කළයුතු වේ.

### පදනම් අදියර

- පදනම් අදියරේ විභාගයට පළමුවරට පෙනී සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන්, අවම වශයෙන් විෂයයන් තුනකට අයදුම් කළ යුතු අතර, ඉතිරි විෂයයන් සඳහා ඊළඟට පැමිණෙන වාරයේදී අයදුම් කළ යුතු ය.
- පළමුවරට විභාගයට පෙනී සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන්හට ඊළඟට එළඹෙන පළමුවන වාරයේදී ම අසමර්ථ වූ පාඨමාලා ඒකකයන් සඳහා නැවත පෙනී සිටිය හැකි ය.
- පළමුවරට විභාගයට විෂයයන් තුනක් හෝ හතරක් සඳහා පෙනි සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන්හට, ඊළඟට එළැඹෙන පළමුවන අවස්ථාවේදීම, යම් නැවත පෙනී සිටින පාඨමාලා ඒකක සමග ඉතිරි විෂයයන් උත්සාහ කළ හැකිය.
- මෙම අදියරේ විභාගවලට පෙනී සිටීම සඳහා සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන කැමති මාධ්‍යයක් තෝරා ගැනීමට ශිෂ්‍ය ශිෂ්‍යාවන්හට හැකි ය.
- මෙම අදියරේ විභාග, පරිගණක ආශ්‍රිත වේ.

### මෙහෙයුම් අදියර

- ඉහත (අ) සහ (ආ) හි දක්වා ඇති අවශ්‍යතාවයනට යටත්ව, විභාගයට එක් පෙනී සිටීමකදී සියලුම විෂයයන්වලට හෝ පාඨමාලා ඒකක වශයෙන් හෝ පෙනී සිටීමට ශිෂ ශිෂ්‍යාවන්ට හැකිය.
- මෙම අදියරේ විභාගවලට පෙනී සිටීම සඳහා සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන කැමති මාධ්‍යයක් තෝරා ගැනීමට ශිෂ්‍ය ශිෂ්‍යාවන්හට හැකි අතර, විභාග 2021 මැයි මස සිට පරීක්ෂනක ආශ්‍රිත ඇගයීම පාදක කර ගෙන පැවැත්වේ.
- තොරතුරු තාක්ෂණ භාවිතය (ITA) සඳහා වැඩමුළුවක් CMA තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේදී පැවැත්වෙන අතර, පාඨමාලා ගාස්තුව රු. 3,500.00 කි.

### කළමනාකරණ අදියර

- ඉහත (අ) සහ (ආ) හි දක්වා ඇති අවශ්‍යතාවයනට යටත්ව, විභාගයට එක් පෙනී සිටීමකදී සියලුම විෂයයන්වලට හෝ පාඨමාලා ඒකක වශයෙන් හෝ පෙනී සිටීමට ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට හැකිය.
- සියලුම විභාගයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් වන අතර, විභාග 2021 මැයි මස සිට පරීක්ෂනක ආශ්‍රිත ඇගයීම පාදක කර ගෙන පැවැත්වේ.

### උපාය මාර්ගික අදියර

- උපාය මාර්ගික අදියරට පැමිණීමට පෙර, ශිෂ්‍යයන් විසින්, පදනම්, මෙහෙයුම් සහ කළමනාකරණ අදියරයන්හි ප්‍රධාන, උපකාරක සහ කුසලතා පාඨමාලාවන් සාර්ථක ලෙස සම්පූර්ණ කළ යුතු වේ.
- පළමුවරට උපාය මාර්ගික අදියරේ විභාගයට පෙනී සිටීමේදී ශිෂ්‍ය ශිෂ්‍යාවන් එම අදියරේ සියලුම විෂයයන්වලට පෙනී සිටීම අවශ්‍ය ය. පළමුවර පෙනී සිටීමෙන් පසු, අසමත් වූ විෂයයන් එකිනෙක පාඨමාලා ඒකක වශයෙන් උත්සාහ කළ හැකි ය.
- සියලුම විභාගයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් වන අතර, විභාග ලිඛිත ඇගයීම් පාදක කර ගෙන පැවැත්වේ

### මුදුන් අදියර (Apex Level)

- මෙම අදියරෙහි සියලුම විභාග පැවැත්වෙන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි.
- AL 1 - විෂයානුබද්ධ සිද්ධි අධ්‍යයනය (Integrative Case Study - ICS) උත්සාහ කළ හැක්කේ, ඊට පෙර ඇති අදියරයන් හතර ම සාර්ථකව සම්පූර්ණ කළ අයට පමණකි. (පදනම් අදියර , මෙහෙයුම් අදියර, කළමනාකරණ අදියර උපාය මාර්ගික අදියර).

  සහ

  AL 1 පාඨමාලා ඒකකය සඳහා අයදුම්කරණ අවස්ථාවේදී ශිෂ්‍යයන් AL 2: පරීක්ෂනක ආශ්‍රිත ගිණුම්කරණය (CBA) සහ AL 3: උසස් වෘත්තීයමය සන්නිවේදන මොඩියුලය (කථන ශිල්පී වැඩසටහන සහ වැඩමුළු මාලාව) සම්පූර්ණ කිරීම හෝ, AL 2 සහ AL 3 පාඨමාලා සඳහා ලියාපදිංචි වී තිබීම හෝ කරනු ලැබ තිබිය යුතු ය.

  (මෙම සංශෝධනය ක්‍රියාත්මක වනුයේ 2021 මැයි විභාගය සහ ඉන් ඉදිරියට ය.)

- AL 1 - විෂයානුබද්ධ සිද්ධි අධ්‍යයනය (Integrative Case Study - ICS) විභාග ලිඛිත ඇගයීම් පාදක කර ගෙන පැවැත්වේ
- AL 2: පරිඝණක ආශ්‍රිත ගිණුම්කරණය (Computer Based Accounting - CBA)

  පරිඝනක ආශ්‍රිත ගිණුම්කරණය (Computer Based Accounting - CBA) යනු විශේෂිත කුසලතා පාඨමාලාවක් වන අතර, එය, ව්‍යාපාරික දත්ත සැකසීමෙහිදී භාවිතා කෙරෙන තෝරාගන්නා ලද ගිණුම්කරණ මෘදුකාංග (උදා: SAG 50) යොදාගැනීම පිලිබඳ පූර්ණ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුමක් ලබාදෙයි. ඒ මගින්, අභ්‍යන්තර සහ බාහිර ගිණුම්කරණ තොරතුරු භාවිතා කරන්නන් සඳහා මූල්‍ය ප්‍රකාශන ලබාදීමත්, තීරණගැනීමේ ක්‍රියාවලියෙහි යෙදී සිටින කළමණාකරුවන්හට වටිනා වාර්තා සැපයීමත් ඉටු කිරීම අරමුණු කෙරේ. විෂය පථයෙන් ආවරණය වන ප්‍රධාන මාතෘකා, න්‍යායයන් සහ ප්‍රයෝගික කරුණුවලින් සමන්විත වේ.

  මෙම ඒකකය සඳහා දේශන CMA තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේදී පැවැත්වෙන අතර, පාඨමාලා ගාස්තුව රු. 10,000.00 කි. කළමනාකරණ අදියර සම්පූර්ණ කළ පසු මෙම විභාගයට පෙනී සිටිය හැකිය.

  මෙම විභාගය, කොටස් දෙකකින් සමන්විත වේ.

  - කොටස I - සිද්ධි පදනම්කරගත් අනිවාර්ය ප්‍රශ්නය
  - කොටස II -සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සැපයිය යුතුය.

- AL 3: උසස් වෘත්තීයමය සන්නිවේදන මොඩියුලය (කථන ශිල්පී වැඩසටහන සහ වැඩමුළු මාලාව)

  CMA අවසාන සාමාර්ථ සහතිකය ලබාගැනීම සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් උසස් වෘත්තීයමය සන්නිවේදන මොඩියුලය (කථන ශිල්පී වැඩසටහන සහ වැඩමුළු මාලාව) සාර්ථක ලෙස සම්පූර්ණකිරීම අවශ්‍ය වේ.

  මෙම වැඩසටහනට සහභාගිවීම සඳහා කළමනාකරණ අදියර සම්පූර්ණ කරන ලද ශිෂ්‍ය ශිෂ්‍යාවෝ සුදුසුකම් ලබති.

  වැඩමුළු මාලාව පැය 36 කින් සමන්විත වන අතර (පැය තුන බැගින් වන සැසි වාර 13) එය, මොඩියුල දෙකක් යටතේ පැවැත්වේ: එනම්, උසස් වෘත්තිය සන්නිවේදන කුසලතා (කථන ශිල්පී වැඩසටහන) සහ ජීවන කුසලතා යන වැඩ සටහන් දෙකයි.

**මොඩියුල 01 - උසස් වෘත්තීය සන්නිවේදන කුසලතා (කථන ශිල්පී වැඩසටහන)**

1) සහාධ්‍යායත්වය සහ ජාලගත කිරීම වර්ධනය කිරීම (Fellowship and networking)
2) බිය පැරදවීම - දක්ෂ කථිකයකුබවට පත්වීම
3) කථනය සඵලදායි ලෙස සකස්කර ගැනීම
4) පෙළඹවීම සඳහා ඇගයීම
5) කථා කිරීමේදී ශබ්දයේ බලපෑම
6) රැස්වීම් ක්‍රියා පිළිවෙල, නායකත්ව භූමිකාව සහ රැස්වීම් කිරීම
7) කථනයේ අගය වැඩි කිරීම සඳහා ශරීර භාෂාව භාවිතය
8) භාෂාව, ව්‍යාකරණ සහ උච්චාරණය
9) කථාවලදී හාස්‍යය ඵලදායිලෙස යොදාගැනීම සහ එහි බලපෑම
10) කලින් සූදානමක් නොමැතිව කථා පැවැත්වීම / නිදහසේ ඇසුරුකිරීම

කථන ශිල්පී වැඩසටහන මගින් සහභාගිකයන්ගේ සන්නිවේදන, නායකත්ව සහ සංවිධානය කිරීමේ කුසලතාවයන් මිතුරු සහ සහෝපකාරී ආකාරයෙන් වර්ධනය කරනු ලැබේ. කාර්ය මාලාවක් හරහා සෑම සතියකදීම සියලුම සහභාගිකයන් විසින් විවිධ භූමිකාවන් විදහාපෑම මගින්, සෑම සහභාගිකයකුම ඵලදායි සහ විශ්වාසය සහිත ඉදිරිපත්කරන්නන් බවට පත්කිරීම, කථන ශිල්පී පුහුණුකරුවන් විසින් සහතික කෙරෙනු ඇත.

**මොඩියුලය 02 - ජීවන කුසලතා**

10) ගිණුම්කරණ වෘත්තීය මත තොරතුරු තාක්ෂණයේ (IT) තාක්ෂණයේ සහ වැඩිදියුනුවීම්වල බලපෑම සහ කථාවලදී power point ක්‍රමය සාර්ථක ලෙස භාවිතාකිරීම
11) කණ්ඩායමක් තුල සාමුහික ක්‍රියාකාරීත්වය සහ කාල කළමනාකරණය
12) ධනාත්මක චින්තනය සහ වෘත්තීය මාර්ගයේ මාර්ග සිතියම (Career path road map)

මොඩියුල 1 සහ 2 සම්බන්ධයෙන් යටත් පිරිසෙයින් සැසි වාර 80% ක හෝ සහභාගිත්වය අනිවාර්ය වන අතර, වැඩමුළු කාලය තුලදී අඛණ්ඩ වාචික ඇගයීම් කරගෙන යනු ලැබේ.

පාඨමාලා ගාස්තුව රු. 10000.00 කි.

## 6.7 විභාග විෂය නිර්දේශයේ සංවිධානය

පාඨමාලා ඒකකවල ප්‍රධාන මාතෘකා, ඒවායේ සාපේක්ෂ වැදගත්කම (බර තැබීම) සමග, විෂය නිර්දේශ ව්‍යුහය යටතේ නියම වශයෙන් දක්වා ඇත. ඉන්පසු, ක්‍රියාකාරකම් කේන්ද්‍රය සහ අන්තර්ගතය යටතේ සෑම මතෘකාවක්ම පැහැදිලි කර ඇත.

ක්‍රියාකාරකම් කේන්ද්‍රය මගින් , ශිෂ්‍ය ශිෂ්‍යාවන්හට ලැබෙන ප්‍රතිපලය පැහැදිලි කර ඇත. එය, උපදේශකවරුන්හට ඉගැන්වීමේ මාර්ගෝපදේශයක් ද වේ. අන්තර්ගතය, මාතෘකාව යටතේ ආවරණය වන උප මාතෘකා පැහැදිලි කර දක්වා ඇත.

## 6.8 විභාග ප්‍රතිපල

පරිඝණක පාදක විභාගවල ප්‍රතිපල, විභාගය පවත්වා සති දෙකක් ඇතුලත නිකුත් කෙරෙන අතර, ලිඛිත විභාගවල ප්‍රතිපල, විභාගය අවසන්වූ දිනයේ සිට දින 50ක් ඇතුලත නිකුත් කෙරේ. විභාග ප්‍රතිපල නිකුත් කරනු ලැබූ වහාම, එම ප්‍රතිපල MY CMA වෙත ලොග්වීමෙන් ශිෂ්‍යයන්හට බලාගත හැකිවන අතර, විස්තරාත්මක ප්‍රතිපල, විභාග අපේක්ෂක අපේක්ෂිකාවන් වෙත තැපෑලෙන් යවනු ලැබේ.

## 6.9 CMA වෘත්තීය විභාග සඳහා ගණක යන්ත්‍ර (calculators) භාවිතය පිලිබඳ මාර්ගෝපදේශනය

පහත ගණක යන්ත්‍ර භාවිතය පිලිබඳ මාර්ගෝපදේශයන් CMA වෘත්තීය වැඩසටහන 2018-2022 සඳහා අදාල වේ.

**භාවිතයට අවසර දී ඇති ගණක යන්ත්‍ර වර්ග**

- CMA වෘත්තීය වැඩසටහන 2018-2022 ට අනුව ගණක යන්ත්‍ර අවශ්‍යවන විෂයයන් සඳහා (විෂයානුබද්ධ සිද්ධි අද්‍යනය ඇතුළුව) විද්‍යාත්මක, වැඩසටහන්ගත කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතා කල හැකිය.

- පදනම් අදියරේ පරිගණක පාදක ඇගයීම් වලදී පරිගණක ගත විද්‍යාත්මක ගණක යන්ත්‍රයක් විභාගයේදී ලැබෙනු ඇත.

**භාවිතය තහනම් ගණක යන්ත්‍ර වර්ග**

- ඕනෑම වැඩසටහන්ගත කළ හැකි සහ අක්ෂර හෝ අක්ෂරාංක දත්ත ගබඩා කල හැකි ගණක යන්ත්‍ර
- ඕනෑම වැඩසටහන්ගත කළ හැකි සහ අවකලනය,අනුකලනය, වීජීය ප්‍රකාශන, පද්ධති සමීකරණ සඳහා විසඳුම් වැනි විශේෂ භාවිතයන් සිදු කල හැකි ගණක යන්ත්‍ර
- බාහිර සන්නිවේදන පහසුකම් හෝ අන්තර්ජාල පහසුකම් සහිත ගණක යන්ත්‍ර
- ජංගම දුරකතනවල ඇති ගණක යන්ත්‍ර

**අනුමත ගණක යන්ත්‍ර වර්ග**

- fx – 100 MS
- fx – 991 ES PLUS
- fx – 991 MS
- fx – 82 MS
- fx – 82 ES PLUS

**වැදගත් උපදෙස්**

අවසරලත් ගණක යන්ත්‍ර භාවිතය පිලිබඳ පූර්ණ දැනුමක් සිසුන් සතුව පැවතිය යුතු අතර විභාග දිනයන්හිදී එහි ක්‍රියාකාරීත්වය පිලිබඳ වගකීම සිසුන් සතු වේ.

උදා: බැටරි සහ සූර්ය කෝෂ ක්‍රියාකාරිත්වය ආදිය.

## 6.10 සහතිකපත්‍ර ප්‍රදානයකිරීම

විභාග ප්‍රතිපල ලේඛනයට අතිරේක ව, එකිනෙක අදියරේ විභාග සම්පූර්ණ කරනු ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්හට සහතිකයක් නිකුත් කරනු ලැබේ.

| අදියර | ප්‍රදානය කෙරෙන සහතිකය |
|---|---|
| පදනම් අදියර | ගිණුම්කරණය සහ ව්‍යාපාර අධ්‍යයන සහතිකය |
| මෙහෙයුම් අදියර | ගිණුම්කරණය සහ ව්‍යාපාර අධ්‍යයන ඩිප්ලෝමා සහතිකය |
| කළමනාකරණ අදියර | ගිණුම්කරණය සහ ව්‍යාපාර අධ්‍යයන උසස් ඩිප්ලෝමා සහතිකය |
| උපාය මාර්ගික අදියර | උපාය මාර්ගික වෘත්තීය සහතිකය |
| මුදුන් අදියර | අවසාන සාමාර්ථ සහතිකය |

# 7. ශිෂ්‍ය ශිෂ්‍යාවන්හට සහ සාමාජික සාමජිකවන්හට වෙනත් අධ්‍යාපන සුදුසුකම් ලැබීමට ඇති අවස්ථා

## 7.1 කළමනාකරණ අධ්‍යයනය පිලිබඳ උපාධිය - (Bachelor of Management Studies BMS) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන දෙපාර්තමේන්තු මගින් පිරිනමන උපාධිය

අවසාන සාමාර්ථය ලැබූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්හට කළමනාකරණ අධ්‍යයන පිලිබඳ (BMS) උපාධි වැඩසටහනේ අදියර 5 සඳහා ලියා පදිංචිවිය හැකි ය.

BMS උපාධිය වර්ෂ හතරක කාලයකට විහිදේ; එය 3 වන අදියර, 4 වන අදියර, 5 වන අදියර සහ 6 වන අදියර ලෙස ව්‍යුහගත කරනු ලැබ ඇත. 6 වන අදියරේදී, ශිෂ්‍යයන්හට අලෙවිකරණය හෝ මානව සම්පත් කළමනාකරණය යටතේ විශේෂීකරණය කළ හැකිය. කළමනාකරණ අදියර සාර්ථක ලෙස සම්පූර්ණ කරනු ලැබ ඇති ශිෂ්‍යයකුහට, 5 වන අදියරේ පාඨමාලා සඳහා ලියා පදිංචි විය හැකි ය. (6 වන අදියරේ විභාගයට පෙනී සිටීමට පෙර ඔහු / ඇය මුදුන් අදියර දක්වා සම්පූර්ණ කළ යුතු ය.) “පරිඝණක සාක්ෂරතාවය” (Computer Literacy) සහ “ශාස්ත්‍රීය අරමුණු සඳහා ඉංග්‍රීසි” (English for Academic Purposes) පාඨමාලා අඛණ්ඩව කරගෙන යාම පිණිස, විවෘත විශ්ව විද්‍යාල නිර්ණායකයන් සම්පූර්ණ කිරීම, CMA ශිෂ්‍යයන් විසින් කළ යුතු වේ.

BMS උපාධිය සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලබන අවධියේදී, ඒ සඳහා සුදුසුකම් සපුරා ඇති ශිෂ්‍යයන්හට CMA ආයතනය විසින් දැනුම් දෙනු ලැබේ.

අයදුම්පත්‍රය සමග පහත දැක්වෙන ලේඛණවල පිටපත් අවශ්‍ය වේ.

- CMA ලියාපදිංචි කිරීමේ කාඩ් පත
- ජාතික හැඳුනුම් පත
- CMA හි ප්‍රතිපලවල විස්තරාත්මක විස්තර පත්‍රිකාව
- GCE O/L., A/L විභාග ප්‍රතිපල සහතික
- වෙනත් සුදුසුකම්
- සේවා පළපුරුද්ද.

